දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය - Faculty of Humanities & Social Sciences

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) පරීක්ෂණය -2020 (පුනර් 2016) - 2022 පෙබරවාරි / මාර්තු
First Examination in Arts (External) - 2020 (Repeat 2016) – February / March 2022

දේවිප්‍ර 1.2 - ක්‍රි.ව. 1832 සිට ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය හා දේශපාලනය
PS 1.2 – Government and Politics of Sri Lanka Since 1832

කාලය පැය (03) තුන යි.

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න. සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගිනි.

---

01. 1832 කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණය මගින් ලංකාවේ ආර්ථික, දේශපාලන සහ සමාජීය කෙෂත්‍රයන්හි කවර ආකාර වෙනස් කම් ඇති වූයේ ද යන්න විමර්ශණය කරන්න.
(ලකුණු 20)

02. "ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය මගින් නිරූපනය වූයේ ජාතික නිදහස දිනා ගැනීමට වඩා සුළු ධණේෂ්වර පංතියේ ආශාවන් ඉටුකර ගැනීමේ උත්සාහයකි" ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරයේ ආරම්භය, අරමුණු, උපක්‍රම, ලබාගත් ජයග්‍රහණ ආශ්‍රිතව ඉහත ප්‍රකාෂය සාකච්ඡා කරන්න.
(ලකුණු 20)

03. 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය ශ්‍රී ලංකාවේ දේශපාලන සංවර්ධනයට කළ දායකත්වය අගයන්න.
(ලකුණු 20)

04. "1948 සෝල්බරි ආණ්ඩු ක්‍රමය මගින් සුළු ජාතීන්ට විශේෂ රැකවරණයක් හිමි කර දී තිබුණි" සාකච්ඡා කරන්න.
(ලකුණු 20)

05. "1972 ප්‍රථම ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යටතේ ගොඩනැගූ වැදගත්ම ආයතනය වූයේ ජාතික රාජ්‍ය සභාවයි" ඉහත ප්‍රකාෂය හේතු සහිතව පැහැදිලි කරන්න.
(ලකුණු 20)

06. " 1978 දෙවන ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මගින් ගොඩනගන ලද නවාංග වර්ථමාන ශ්‍රී ලංකාවේ බෙහෙවින් ම විවේචනයට භාජනය වේ" පැහැදිලි කරන්න.
(ලකුණු 20)

07. ශ්‍රී ලංකාවේ 202 පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසුව වාර්ගික දේශපාලන පක්ෂ වල ක්‍රියාකාරීත්වය තරමක් අඩපණ වී ඇත. ඉහත ප්‍රකාෂය විවේචනාත්මකව විභාග කරන්න.
(ලකුණු 20)

08. ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රියාදමය තුළ සාම්ප්‍රදායික වාමාංශය සහ නව වාමාංශය ඉටු කළ සහ ඉටු කරන කාර්ය භාරය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.
(ලකුණු 20)

09. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය පරිපාලනය සඳහා ගෙඩනගා ඇති ප්‍රාදේශීය සභා ඵළදායී කාර්යභාරයක් ඉටු කරන්නේ ද? පරීක්ෂා කරන්න.

(ලකුණු 20)

10. පහත සඳහන් මාතෘකා දෙකක් **(02ක්)** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. වත්මන් පොදුජන එක්සත් පෙරමුණ රජයේ විදේශ ප්‍රතිපත්තිය

ii. හරිත කෘෂිකර්මාන්තයක් සඳහා වූ වැඩසටහණේ දේශපාලන සහ පරිපාලන නිළධාරීන්ගේ ක්‍රියාකාරීත්වය

iii. ශ්‍රී ලංකාවේ වත්මන් විපක්ෂයේ භූමිකාව

iv. ශ්‍රී ලංකාවට නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම පිළිබඳ මතය

(එක් කොටසකට ලකුණු 10 බැගින් කොටස් **02**ක් සඳහා උත්තර ලිවිය යුතු ය )

(ලකුණු 2x10 = 20 )

**********